# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2019

2023 අප්‍රේල්/ මැයි

### මානවශාස්ත්‍ර පීඨය

### ප්‍රතිබිම්බ කලා (නව/පැරණි නිර්දේශය)

**ව්‍යවහාරික ඡායාරූපකරණය IMAT – E 1025**

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

01. දෛනික ජීවිතය කෙරෙහි ඡායාරූපකරණය කෙතරම් බලපෑමක් සිදුකරනු ලබන්නේදැයි නිදසුන් සහිතව විස්තර කරන්න.

02. පහත සඳහන් මාතෘකා දෙක අතර සමාන අසමානතා විස්තර කරන්න.

    I. චිත්‍රාගාර ඡායාරූපකරණය (Indoor Photography)
    II. එළිමහන් ඡායාරූපකරණය (Outdoor Photography)

03. ඡායාරූපමය පුවත්පත් කලාව යනු කුමක්දැයි හඳුන්වා, පුවත්පත් ඡායාරූප ශිල්පියෙකු වෙත නව තාක්ෂණය විසින් ලබාදී ඇති පහසුකම් කවරේදැයි පැහැදිලි කරන්න.

04. "සම්ප්‍රදායික සිරිත් විරිත් අනාගතයට වාර්තා කොට තැබීම මංගල ඡායාරූපකරණයේ ප්‍රමුඛ අරමුණ වේ." ඉහත කියමන පිළිබඳ පක්ෂව හෝ ප්‍රතිපක්ෂව කරුණු ඉදිරිපත් කරන්න.

05. ක්‍රීඩා ඡායාරූපකරණයේ යෙදෙන ඡායාරූප ශිල්පියෙකු සතු විය යුතු ගුණාංග මොනවාදැයි ලයිස්තුගත කර, ඉන් වැදගත්ම යැයි හැඟෙන කරුණු දෙකක් විස්තර කරන්න.

06. ආධුනික ඡායාරූප ශිල්පියා හා වෘත්තීය ඡායාරූප ශිල්පියා අතර ඇති වෙනස පැහැදිලි කර, ආධුනිකයෙකු වෘත්තීය ඡායාරූප ශිල්පියෙකු බවට පත්වීමේ දී අනුගමනය කළ යුතු යැයි ඔබ අපේක්ෂා කරන කරුණු මොනවාදැයි සඳහන් කරන්න.

07. "කෙවින් කාටර් (Kevin Carter) ලෝක ඡායාරූප ඉතිහාසයේ නොමැකෙන මතකයක් තැබූ ඡායාරූප ශිල්පියෙකි." විමසන්න.

08. කෙටි සටහන් ලියන්න.

    I. වනජීවී ඡායාරූපකරණය (Wildlife Photography)
    II. වීදි ඡායාරූපකරණය (Street Photography)
    III. දියයට ඡායාරූපකරණය (Underwater Photography)
    IV. අලේඛ්‍ය ඡායාරූපකරණය (Portrait Photography)

************************************